CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# අගවිනිසුරු ආචාර්ය ශිරාණී බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝග ක්‍රියාමාර්ගය පිළිබඳව වූ මාධ්‍ය නිවේදනය

***2012 නොවැම්බර් 13, කොළඹ, ශ්‍රී ලංකාව*** : අග විනිසුරු ආචාර්ය ශිරාණී බණ්ඩාරනායක මහත්මියට එරෙහිව දෝෂාභියෝග ක්‍රියා මාර්ගයක් ආරම්භ කරනු ලැබීම පිළබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය බරපතල සැලකිල්ල ප්‍රකාශ කොට සිටී. පුවත්පත් වල පළවූ වාර්තා ගණනාවක් මගින් හෙළිදරව් කෙරෙන පරිදි කථානායක වරයාට ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවක ආකාරයෙන් ඇයට එරෙහිව චෝදනා ගණනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ තිබේ. මෙම ක්‍රියාමාර්ගයට මුලපුරනු ලැබූ සන්දර්භය, ස්ථාවර නියෝග 78 A හී දැක්වෙන පාර්ලිමේන්තුව මගින් ස්ථාපිත කොට ඇති දෝෂාභියෝගය විභාගයට ගැනෙන ක්‍රියාපටිපාටිය, අගවිනිසුරුවරියට එරෙහිව ඉදිරිපත් කොට ඇති චෝදනා ගණනාවක අන්තර්ගතය යනාදිය දැඩි ලෙස කනස්සල්ල දනවනසුලු ස්වභාවයක් ගනී.

## සන්දර්භය

දෝෂාභියෝග ක්‍රියා මාර්ගයට මුලපුරණු ලැබූ සන්දර්භය සහ එම ක්‍රියාමාර්ගයෙහි කාල සැකසුම යනාදිය මගින් දැඩි ලෙස පෙන්නුම්කරන්නේ අධිකරණය විසින් විධායකය වෙත දක්වනු ලබන කුමන මට්ටමක හෝ ප්‍රතිරෝධයක නොනිමී පවතින ගිනි පුපුරක් හෝ වේනම් එයද නිවා දැමීමට රජය විසින් සිතාමතාම ගනු ලබන උත්සාහයකි. නගර සහ ග්‍රාම සැලසුම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ දිවිනැගුම පනත් කෙටුම්පත පිළිබඳව වූ තම විනිශ්චයෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ එම පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්ථකයෙහි ඇතුළත් කරනු ලැබීමට පෙර සියලු පළාත් සභාවන් වෙත යොමු කිරීම අවශ්‍යවන බවය. එම අවස්ථා දෙකෙහිදීම නම් කරනු ලැබූ විනිශ්චය මණ්ඩලයන් හී සභාපතිත්වය අග්‍රවිනිශ්චයකාරවරිය විසින් දරනු ලැබිණි. පළාත් සභා විෂයයන් පිළිබඳව නීති පැනවීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් ලබා දෙනු ලැබ ඇති බෙහෙවින් ඌණ මට්ටමක වූ බලය බෙදීම පවා දුර්වල කිරීමට ගනු ලැබූ රජයේ උත්සාහය මෙම නඩු තීන්දු මගින් නවත්වනු ලැබිණි. දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳව අධිකරණයේ තීරණය දැනුම්දීමෙන් පසුව ඇතිවූ සිදුවීම් පිළිබඳව වූ ලුහුඬු විස්තරයක් සිත්ගන්නාසුළු බවකින් යුතුවේ.

2012 සැප්තැම්බර් 17 වන දින හෝ ආසන්න දිනයකදී දිවිනැගුම කෙටුම්පත් පනත අභියෝගයට ලක්කරන ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ තීන්දු) 1-3/2012 පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව කථානායක වරයා වෙත දැනුම්දෙනු ලැබිණි. ඉන්පසු සැප්තැම්බර් 19 වන දින[1] අගවිනිසුරුතුමිය සභාපතීත්වය දරන අධිකරණ සේවා කොමිසමේ ලේකම් මංජුල තිලකරත්න මහතා විසින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශයක් සිංහල පුවත්පත්වල පළවිය. අධිකරණයේ ස්වාධීනත්වය විනාශ කිරීම සඳහා උත්සාහයන් ගැනෙමින් පවතින බව මෙම ප්‍රකාශය මගින් චෝදනා කෙරිණි. එමෙන්ම පසුව ජනාධිපතිවරයා විසින්ම හෙළිදරව් කෙරුනු, අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයන් තමන් සමග හමුවකට අරලියගහ මන්දිරයට කැඳවීමේ උත්සාහයක් පිළිබඳව වූ ඡායාමාත්‍රික වක්‍ර සඳහන් ද මෙම ප්‍රකාශයෙහි විය. මෙම ප්‍රකාශය නිකුත් කෙරුනේ රජයට එරෙහිව ගනුලැබූ දිවිනැගුම අධිකරණ තීරණය පිළිබඳව ඇතැම් විවේචකයන් රජයේ රූපවාහිනිය හා ගුවන් විදුලිය ඔස්සේ අගවිනිසුරුතුමිය හා අධිකරණය අපවාදයට ලක් කිරීමේ ස්ථාවර උත්සාහයන් ගනුලැබූ සන්දර්භයක් තුළය. අධිකරණ සේවා කොමිසමේ පළමු ප්‍රකාශයට අනතුරුව 2012 සැප්තැම්බර් 28 වන දින හෝ ඊට ආසන්න දිනයක තිලකරත්න මහතා විසින් බිය දනවන සුළු හෙළිදරව් කිරීමක් කරන්නට යෙදිනි. එය නම් අධිකරණ පද්ධතියේ ඉහළම තනතුර දරන්නා ගේ සිට කොමිසමේ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල අයගේ ආරක්ෂාව අනතුරට පත්වන තත්ත්වයක් උද්ගතව පවතින බවයි.[2] ඔක්තෝබර් 7 වන දින මෙම බිය ප්‍රායෝගිකව සනාථ කෙරිනි. ගල්කිස්ස හෝටල් පාරේ නවත්වා තිබූ තම මෝටර් රථය තුළ සිටි තිලකරත්න මහතා වෙත මහ දවාලේම නාඳුනන ප්‍රහාරකයන් කිහිපදෙනෙකු විසින් නැවත නැවතත් එල්ල කරන ලද පිහිපහරවල් වලින් ඔහු බරපතල ලෙස

[1] සැප්තැම්බර් 19 ලක්බිම පුවත්පත් ලිපිය

[2] http://www.dailymirror.lk./news/2228-jsc-secratary-danger-to-their-security-html

තුවාල ලැබීය. 2012 ඔක්තෝබර් 10 වන දින නිකුත් කරන ලද ප්‍රකාශයක් මගින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම ප්‍රහාරය හෙළා දුටු අතර එම ප්‍රකාශය මගින් විරුද්ධ මතධාරීන් බිය ගැන්වීම සහ රටේ පැතිර පවත්නා දඬුවම් නොලබා වරද කිරීමට ඉඩසලසන වාර්තාවරණය පිළිබඳව අවධානයට යොමු කර වීම සිදුකෙරිණි. ඔක්තෝම්බර් 15 වන දින අලවා තිබූ සිංහලෙන් ලියැවුනු පෝස්ටරයක් මගින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා දිවිනැගුම කෙටුම්පත් පනතට විරෝධය පළකිරීම පදනම් කොටගෙන ඔහු රට බෙදීමට කටයුතු කරන්නෙකු ලෙස අපවාදයට ලක්කරනු ලැබීම පිළිබඳව අප ඔක්තෝම්බර් 16 වන දින අවධානයට යොමු කළෙමු. මේ අතර, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ රජයේ ප්‍රබල සාමාජිකයන් ගණනාවක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අහෝසි කරනු ලෙස ප්‍රසිද්ධියේ ඉල්ලීම් කර ඇත.

එබැවින්, විරුද්ධ මත යටපත් කිරීමටත්, අධිකරණයේ ස්වාධීනත්වය විනාශ කිරීමට සහ 13 වන සංශෝධනය මගින් බලය බෙදීමක් සිදුවන බවට ඇති අවම සහතිකය ක්‍රියාත්මක කිරීමේ ඉඩ ප්‍රස්ථාවන් අනතුරට ලක් කිරීමටත් ගනු ලබන, මෑතකාලීනම මෙන්ම වඩාත්ම භයානක වූ, රෙජීමයේ උත්සාහය අගවිනිසුරුවරියට එරෙහිව මෙසේ දෝෂාභියෝග ක්‍රියාමාර්ග ඇරඹීම වන බව අපගේ දැඩි විශ්වාසයයි.

## ක්‍රියාපටිපාටිය

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 78 A හී දෝෂාභියෝග ක්‍රියාමාර්ගය සඳහා නියම කොට ඇති ක්‍රියා පටිපාටිය ස්වභාවික යුක්තිය පිළිබඳව වූ මූලධර්මය හා නොගැලපෙන්නක් බවට වන කරුණ පිළිබඳවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සැලකිල්ල යොමු වී ඇත. මෙම ක්‍රියාපටිපාටිය යටතේ චෝදනාවන් ඇතුළත් යෝජනාවෙහි වූ චෝදනාවන් කථානායක වරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ගෙන් සමන්විත වන තේරීම්කාරක සභාවකට යොමු කරනු ලැබේ. එම කාරක සභාවේ කාර්යභාරය වනුයේ ඒවා විභාග කොට බලා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමයි. විෂමාචාර ක්‍රියාවන් පිළිබඳව වූ චෝදනාවන් සම්බන්ධයෙන් විභාග කිරීමේ සහ ඒ පිළිබඳව තීන්දු ගැනීමේ ක්‍රියාදාමය පැහැදිලිවම අධිකරණමය හෝ අර්ධ අධිකරණයමය ස්වභාවයකින් යුක්ත වූවකි. එබැවින් එහි දී ස්වභාවික යුක්තිය පිළිබඳව වූ පිළිගත් රීතීන් භාවිත වීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. කෙසේ නමුත් යෝජනාව පිළිබඳ දැන්වීම අත්සන් කළ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් තේරීම්කාරක සභාව තුළ ක්‍රියාත්මක වීම වළක්වන හෝ අගවිනිසුරුතුමිය ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේදී ඡන්දය පාවිච්චි කිරීම වළක්වන පැහැදිලි වාරණයක් නොපවති. වැඩිදුරටත්, මෙසේ විනිසුරු වරයෙකු ඉවත් කිරීම සිදු කළයුතු වන්නේ ''ඔප්පු වූ විෂමාචාර ක්‍රියාවන් සහ අසමත්බව'' හේතුකොට ගෙන පමණක් වුවද මෙසේ විභාග කිරීමේ ක්‍රියාදාමය පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙතම පැවරීම මගින් ස්ථාවර නියෝගයන් විසින් පක්ෂවාදී වූ තීන්දු ගැනීමක් සඳහා පුළුල් ලෙස දොර විවර කර තැබීමක් සිදුවේ. මේ මගින් පක්ෂපාතීත්වයට එරෙහි රීතිය මූලික වශයෙන්ම අනතුරට ලක්වේ. වෙනත් අධිකරණය ක්‍රමයන් හී, චෝදිත වැරදි පිළිබඳව විභාග කිරීම භාර වූවන්ගේ ස්වාධීනත්වය සහතික කිරීම මගින් දෝශාභියෝග ක්‍රියාමාර්ගයන් හීදී ස්වභාවික යුක්තියට ඇති අයිතිය සුරක්ෂිත කරනු ලැබ ඇත. උදාහරණයක් ලෙස, ඉන්දියාවේ, 1968 විනිසුරුවරුන්ගේ විභාගයන් පිළිබඳ පනත මගින්, තනතුර දරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරවරයෙකු, මහාධිකරණයක තනතුර දරන විනිශ්චකාරවරයෙකු සහ ප්‍රමුඛ හා විශිෂ්ඨ නීතිවේදියකුගෙන් සමන්විත ත්‍රෛ සාමාජික කමිටුවක් කථානායක වරයා විසින් පත්කිරීම දෝෂාභියෝග ක්‍රියාමාර්ගයකදී චෝදනාවන් විභාග කිරීමේ දී අවශ්‍ය කරවනු ලැබ තිබේ.

එබැවින්, අධිකරණයේ ස්වාධීනත්වයට තර්ජන එල්ල වී ඇති සහ පාර්ලිමේන්තුව විධායකයේ පාලනයට සපුරා යටත් කරගනු ලැබ ඇති වත්මන් වාර්තාවරණය තුළ, නිසි ක්‍රියාදාමයෙහි අයිතීන් නොපැවතීම මගින් දෝෂාභියෝග ක්‍රියාදාමය නූතන මර්ධන පරීක්ෂණ සභාවකට ස්වල්පයක් වැඩි වූ යමක් බවට පත්විය හැකිය යන කරුණ කෙරෙහි අපගේ දැඩි සැලකිල්ල යොමු වී ඇත.

## චෝදනාවන්

දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති යෝජනාවේ අන්තර්ගත චෝදනාවන් ගණනාවක් පිළිබඳව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කනස්සල්ලට පත් වෙයි. අගවිනිසුරුවරිය විසින් ලේඛනගත කරන ලද නඩු තීන්දු වල අන්තර්ගතය පදනම් කොට ගෙන ඇය වෙත වරද පැවරීමට මෙහි ඇතැම් චෝදනා මගින් උත්සාහ කෙරෙන බවක් පෙනේ. මෙම චෝදනා මගින් අධිකරණයේ සාමාජිකයන් හට බියගන්වන සුළු බලපෑමක් ඇති වන අතර අධිකරණ නිලයන් තුළ දැනටත් ඉතිරිව පවත්නා යම් ස්වාධීනත්වයක් ක්‍රමානුකූලව කඩා දැමීමට කරනු ලබන උත්සාහයක් ලෙස ද පෙනී යයි. පුවත්පත් වල පළවූ පරිදි වන එක් චෝදනාවක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග වන සබඳතාවක් ගැන වූ

සඳහනක් ද ඇති බව අපගේ නිරීක්ෂණයට ලක්ව ඇත. වාර්තා වන පරිදි චෝදනාව මෙපරිද්දෙන් වෙයි. ''ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක් වීමට ප්‍රථම කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ කථිකාචාර්ය වරියකව සිටියදී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාලහාමිලාගේ ශිරාණි අංගුමාලා බණ්ඩාරනායක මහත්මියගේ ලිපියක් ප්‍රකාශයට පත්කර තිබූ Groundview නැමති මාධ්‍ය ප්‍රකාශන අංශය අයත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැමති ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු පෙත්සම් අංක 02/2012 දරන පෙත්සම අසා තීරණයක් ලබාදී ඇති හෙයින් ද''. මේ සම්බන්ධයෙන් අප සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ගොනු කරන ලද නඩුව වූයේ SC (SD) 3/2012 වන බව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ 1996 ජූනි මස වන බව, Groundviews නම් වූ අපගේ අන්තර්ජාල ප්‍රකාශනය ආරම්භ කරනු ලැබූයේම 2006 වසරේදී එනම් ආචාර්ය බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක් ලෙස දිවුරුම් දී වසර 10කට පසුව වන බව හා Groundviews වෙබ් අඩවිය වෙත මේ දක්වා ආචාර්ය බණ්ඩාරනායක මහත්මියගේ කිසිදු ලිපියක් හෝ ලේඛණයක් ලැබී හෝ එවැන්නක් එමඟින් ප්‍රකාශයට පත්කොට හෝ නොමැති බවත්ය. අනෙකුත් චෝදනා පිළිබඳවද අපගේ සැලකිල්ල යොමු වන නමුත් මෙම අවධියේදී ඒවා පිළිබඳව අපගේ විවේචනාත්මක අදහස් පළකිරීමෙන් අපි වැළකී සිටින්නෙමු.

## නිගමනය

අවසන් වශයෙන්, දෝෂාභියෝග ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ප්‍රතිචාරයක් ලෙස සමාජයේ සියලු තලයන්ගෙන් පලවන පුළුල් කැළඹීම පිළිබඳව අපගේ සැලකිල්ල යොමු වී ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍යකරණයේ මෙම ගමන් මග පිළිබඳව මෙසේ පළවන සැලකිල්ල මඟින් අප දිරිමත් කරනු ලැබ ඇත. පැවැත්ම උදෙසා අරගලයක යෙදෙමින් පවතින අපගේ ප්‍රජාතන්ත්‍රවාදය නොනැසී පවත්වා ගන්නා ආයතනයන් මෙසේ සීඝ්‍ර ලෙස කඩා බිඳ දමනු ලැබීම කෙරෙහි මෙසේ පුරවැසියන් විසින් කෝපය පළ කිරීම දිගින් දිගටම සිදුකළ යුතු යයි අපි ඉල්ලා සිටින්නෙමු. ඕනෑම ප්‍රජාතන්ත්‍රයක නිමැවුම කෙරෙහි අධිකරණයේ ස්වාධීනත්වය මූලික වූ වැදගත්කමක් උසුලයි. එමෙන්ම එය අහෝසි කර දැමීම සඳහා වන මෙම මෑතකාලීනම වූ උත්සාහයනට එරෙහි වීම සඳහා අප එක්සත් නොවේ නම් අප තවමත් භුක්ති විඳින්නාවූ කප්පාදු කරනු ලැබූ නිදහස සහ අයිතීන් ද නුදුරු අනාගතයේදීම අනතුරට ලක් වන බව කිවයුතුව ඇත.

###

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකාවේ ගැටුම් පරිවර්තනය හා යහපාලනය සඳහා ආයතනයන් ශක්තිමත් කිරීමේ හා හැකියා වර්ධනයේ හදිසි අවශ්‍යතාවයක් පවතින බවට හා පක්ෂවාදී නොවන සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම ක්‍රියාදාමය වෙත ඉටුකළ යුතුවූ වැදගත් සහ නිර්මාණශීලී දායකත්වයක් පවතින බවට වූ දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙනයි රාජ්‍ය ප්‍රතිපත්ති විෂයයෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින් බලාපොරොත්තු වන්නාවූ ප්‍රධාන භූමිකාව පූර්වක්‍රියාකාරී හා මැදිහත්කාරක එකක් වන අතර හිංසාවෙන් තොරවූ ගැටුම් නිරාකරණය හා ප්‍රජාතන්ත්‍රික රාජ්‍යකරණය සඳහා වූ ප්‍රතිපත්ති විකල්පයන් ව්‍යාප්ත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම ඉලක්ක කොට ගත්තක් වෙයි ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් හට, බලපෑම් කරනු ලබන ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගන්නාවූ හා වර්ධනය කරන්නාවූ ප්‍රධාන පර්යේෂණ සංඝටකයක්ද ඇතුළත් වේ.

Website : www.cpalanka.org
Facebook : www.facebook.com/cpasl
Twitter : www.twitter.com/cpast